# ථේරවාද 'භවංග චිත්ත' සංකල්පය

කරපික්කඩ සෝභිත හිමි

ථේරවාදී සම්ප්‍රදායානුගත දාර්ශනික චින්තනයන් අතර පසුකාලීනව ඉතා දීර්ඝ වශයෙන් සාකච්ඡාවට භාජනය වූ සිද්ධාන්තයන් ලෙස ''භවංග චිත්තය'' පිළිබඳ ආකල්පය දැක්වේ. ආදි බුදුසමය තුළ "භවංග චිත්ත" පිළිබඳ සෘජු දේශනාවක් දක්නට නොලැබෙන අතර, එහි ඡායාමාත්‍ර වශයෙන් ඇති දේශනා රැගෙන මෙම සංකල්පය පසුකාලීන නිකායාන්තර බුදුසමය තුළත් විශේෂයෙන් ආභිධම්මික අධ්‍යයන තුළත්, අට්ඨකතා සාහිත්‍යය තුළත් සාකච්ඡාවට භාජනය වී ඇත. බොහෝ උගතුන්ගේ මතයට අනුව මේ පිළිබඳ පළමුව සාකච්ඡා වී ඇත්තේ අභිධර්ම පිටකයට අයත් පට්ඨානප්පකරණය තුළය.[1] එහි දැක්වෙන ''භවංග ආවජ්ජනාය'' යන්නෙන් ප්‍රකෘති සිත, නොකිළිටි සිත යන අරුත් දක්වා ඇත. එසේම එය අශෛක්‍ෂ්‍ය වූ ඉන්ද්‍රිය සංස්කාරයන්ගෙන් ද[2] ශෛක්‍ෂ්‍ය වූ විජ්ජා සංඛාරයන්ගෙන් ද,[3] කුසල අකුසල ධර්මයන්ගෙන් ද වෙනස් වූවක් ලෙස දක්වා ඇත. එය සාස්‍රව හා අනාස්‍රවයන් ඉක්ම වූ ප්‍රකෘති ප්‍රවෘත්ති නොකිළිටි ප්‍රභාස්වර තත්ත්වයක් ලෙස මෙහි තව දුරටත් විස්තර කොට ඇත. මීට අමතරව පශ්චාත් පේටක ග්‍රන්ථයක් ලෙස මිළිඳු පඤ්හය තුළ මෙම භවංග චිත්ත සංකල්පය පිළිබඳ සාකච්ඡා වී ඇති අයුරු දැකගත හැකි වේ. එහි අද්ධාන වග්ගයට අයත් ප්‍රථම ප්‍රශ්නයේ දී යමෙක් මෙලොවින් චුතව උපදින විට ඔහු මෙම පුද්ගලයාම ද නොඑසේ නම් වෙන අයෙකු ද යන කරුණ මිළිඳු රජු විමසා ඇත. එකී ප්‍රශ්නය

විමසීමේ කෙළවර දී නාගසේන හිමියෝ **"එව මෙව මහාරාජ ධම්ම සන්තති සන්දහති"**[4] යනුවෙන් ගලා යන ධර්ම පහුරක් ගැන සඳහන් කොට ඇතත් එය භවාංග සංකල්පයට සම්බන්ධකොට විස්තර කිරීමක් සිදුකොට නොමැත. නමුත් මෙහි විග්‍රහ වන්නා වූ නින්ද හා නිදාගත් තැනැත්තාගේ අවස්ථාවන්හි එන තුන්වන අවස්ථාව ලෙස දක්වා ඇත්තේ සිත භවංග ගත වීමයි. එසේම වනගත වූ යෝගියෙකු මුලින්ම වනයේ කුතුහලය උපදවන ශබ්ද ඇති අවස්ථාවේ සියුම් වූ අර්ථ විමසන අතර, එයින් පසුව සිත සමාධිගත කරගනු ලබයි.[5] එසේ සමාධිගත වූ චිත්තය තුන්වන අවස්ථාවේදී ගැඹුරට සමාධිගත කරවනු ලබන අතර, එය භවංග චිත්තයේ අවස්ථාවක් ලෙස දක්වා ඇත. එසේම පශ්චාත් පේටක ග්‍රන්ථයක් ලෙස දක්වන නෙත්තිප්ප්‍රකරණයෙහි ද "භවංග" යන වචනය අවස්ථා කීපයක යොදා ගන්නා අයුරු දැකගත හැකි වේ.[6] එහි දැක්වෙන උපායාසය අභ්‍යන්තරය දවන ගුණයක් ලෙස හඳුන්වා ඇති අතර, එය භවයට හේතුභූත කාරණයක් වශයෙන් ද හඳුන්වා තිබේ. මෙසේ භවයට අංග වූ කරුණු තුළින් සංසාරය සිදුවන අතර, එකී අංගයෝම "භවංග" ලෙස දක්වයි. එනම් උපායාසාදිය යි. ඒවා සියල්ල මානසික අංගයන් වන අතර, භවාංග විඤ්ඤාණය ලෙස පසුකාලීනව විග්‍රහ වන්නේ ද මෙකී සාධකයෝම ය.

භවංග චිත්තය පිළිබඳ මෙසේ පසුකාලීන නෛයායාචාරීන් වහන්සේලා පුළුල් ලෙස විග්‍රහයන් සිදුකිරීමට හේතු භූත වූ ප්‍රධාන සාධකයක් එකී අධ්‍යයනය තුළින් දැක්විය හැක. එනම් ආදි බුදුසමය තුළින් ඍජු ලෙස විවරණය නොවූ සත්ත්වයාගේ භවගාමී තත්ත්වය තුළ එකි සම්බන්ධය කවර ආකාරයෙන් සිදුවන්නේ ද යන පුළුල් වූ පැනයට පිළිතුරක් ලබා දීම පිණිස යි. භවගාමීත්වය පිළිගන්නා වූ බුදු සමය තුළ මරණින් මතු භවය තුළ එකම පුද්ගලයෙක් හෝ එකම ධාරාවක් ගමන් කරනු ලබන්නේ ද? එසේ නොමැතිනම් එහි අනෙකක් හෝ අනෙකකු ගමන් කරන්නේ ද යන්න බුදුන් දවස පවා නොයෙක් පුද්ගලයන් විෂයෙහි පැන නැගුණු ගැටළුවකි. ම.නි. මහාතණ්හාසංඛය සූත්‍රයේ දැක්වෙන සාති භික්ෂූන් වහන්සේ මෙම ගැටළුවෙන්



යුක්ත වූ අයෙක් ලෙස දැක්වෙන අතර, උන්වහන්සේ දැරූ සංසාරගත භාවය බුදුරජාණන් වහන්සේ විසින් නින්දා සහගතව ප්‍රතික්ෂේප කොට ඇත.[7] එහිදී බුදුරජාණන් වහන්සේ දක්වන පටිච්චසමුප්පාදගත විඤ්ඤාණමයවූ භවගාමීත්වය පසුකාලීන ථෙරවාද අට්ඨකථාචාරීන් වහන්සේලා මෙම භවංග චිත්ත සංකල්පය තුළින් විග්‍රහ කිරීමට යොමුවන්නට ඇතැයි සිතිය හැක.

මෙහි දී ආචාර්ය බුද්ධඝෝෂ පාදයන් විසින් රචිත විසුද්ධිමාර්ගය තුළ උක්ත කාරණය විෂයෙහි පුළුල් වූ විග්‍රහයක් දක්නට ඇත. පළමු අටුවා ග්‍රන්ථය වශයෙන් සැළකෙන විසුද්ධි මාර්ගය ත්‍රිපිටකයම අලලා විස්තරාර්ථ සපයන ලද බව ප්‍රකටය. මිළින්ද ප්‍රශ්නයෙන් පසුව භවංග චිත්ත සංකල්පය පුද්ගලයාගේ භවගාමී ජීවිතය හා සම්බන්ධ කොට විවරණය කිරීමට ගත් පළමු උත්සහය විසුද්ධි මාර්ගයෙන් හඳුනාගත හැකි අතර, එය තවත් බොහෝ ගැටළුවලට විසඳුමක් බව පෙනී යයි. මෙතෙක් පැවති "භවඞග" යන වචනය "භවඞග විඤ්ඤාණය, භවඞගසොතය" වැනි වචනවලට නඟමින් ගැඹුරු විග්‍රහයක් සඳහා අවැසි පදනම විසුද්ධිමාර්ගය සපයා ඇත. එහිලා භවගාමී පුද්ගලයාගේ අවිච්ඡින්න ජීවන ප්‍රවාහය තහවුරු කිරීම සඳහා විසුද්ධිමාර්ගය තුළ භාවිත කොට ඇති න්‍යායන් විමසා බැලීම වැදගත්වන අතර, එය පසුකාලීනව රචනාවන අභිධර්ම අටුවා, ටීකා ග්‍රන්ථාදියට ද ඡායාමාත්‍රයක් වී ඇති බව දැක්විය හැකිය.

විසුද්ධිමග්ගය මෙන්ම පසුකාලීන ආභිධම්මික ග්‍රන්ථවලට අනුව, මූලිකවම පුද්ගල චිත්ත හෙවත් සිත් අසූනවයක් (89) හෝ එක්සිය විසි එකක් (121) දක්වා ඇත. එසේම සත්ත්වයන් උපදින භූමි වශයෙන්, මෙම සිත් කොටස් හතරකට බෙදේ. එනම්, පසිඳුරන් හා සම්බන්ධ වූ කාමාවචර සිත් පනස් හතරකි. (මනුෂ්‍ය, ප්‍රේත, නරක, අසුර, දේව) දෙවැන්න නම්, රූපාවචර සිත් පහලොව (15) සහ අරූපාවචර සිත් දොළස (12) අයත්වන බ්‍රහ්මයන් සඳහා පහළවන සිත් ය. සිව්වැන්න නම්, ලෝකය ඉක්මවා ගිය ලෝකුත්තර නමින් හැඳින්වෙන සිත් අටයි. මේවා නිවනට අරමුණු වේ. සෝවාන්, සකෘදාගාමී, අනාගාමී සහ

අරිහත් යන මාර්ගඵල හා මෙම සිත් සම්බන්ධ වී තිබේ. මෙම සිත් විවිධ කොටස්වලට බෙදී යන්නේ ඒවායෙහි ක්‍රියාකාරීත්වය අනුව ය. ඒ අනුව කුසල, අකුසල, විපාක වශයෙන් ප්‍රධාන වර්ග කිරීම් තුනක් මෙහි දක්නට ඇත. ඒවා අතරින් ද, සමහරක් සහේතුක හා අහේතුක වේ. මේ සියලු සිත් අතුරින් තිසිහයක් (36) විපාක සිත් ගණයට වැටේ. විපාක යනුවෙන් අදහස් කරන්නේ පෙර කරන ලද කර්මයන්ට අනුව පහළ වන කුසල හෝ අකුසල සිත්වලට සම්බන්ධ වූ විපාකය යි. මෙම සිත් අතුරින් දහනවයකට[8] භවඞග කෘත්‍ය සිදුකළ හැකි බව අභිධර්මය දක්වයි. ඒවා නැවත බෙදිය හැකිය. එනම්,

- ❖ අකුසල විපාක සන්තීරණ සිත් 1
- ❖ කුසල විපාක සන්තීරණ සිත 1
- ❖ සහේතුක කාම විපාක සිත් 8
- ❖ රූප විපාක සිත් 5
- ❖ අරූප විපාක සිත් 4

යන විපාක සිත් දහනවය (19) යි. මේවා කර්ම, කර්ම නිමිති, යන ධර්මයන්ගෙන් එකක් අරමුණු වී විපාක වශයෙන් ප්‍රතිසන්ධිය ඇතිවන බව පෙන්වා දී තිබේ.[9] මේ දහනවයක් වූ විපාක විඥානයන්ගේ ප්‍රතිසන්ධි කෘත්‍ය හෙවත් භවඞග චිත්තයේ ක්‍රියාකාරීත්වය තුළින් සත්ත්වයකුගේ ප්‍රතිසන්ධිය පවතින බව විසුද්ධිමග්ගය දක්වයි.[10] ප්‍රතිසන්ධිය යනු ''අතීත භවයෙන් අනික් භවය නැවත නැවත ගැළපීම් කරණය සිදුකරන්නා වූ සාධකයයි. හෙයින්ම මෙම චිත්තය ප්‍රතිසන්ධි චිත්ත නම් වේ.''[11]

එම ප්‍රතිසන්ධි විඤ්ඤාණය මව් කුසක හටගනු ලබන්නේ ඉහත කී කර්ම, කර්ම නිමිති හෝ ගතිනිමිති අවස්ථාවකට අනුව බව පෙන්වා දී තිබේ. මෙහිලා වැදගත් කාරණාව වන්නේ එලෙස ප්‍රතිසන්ධි දුන් විඤ්ඤාණය මඟින් නිපද වූ යම් සිතක් වේ ද, එම සිත ලුහු බඳිමින් එම විපාක විඥානයම, ප්‍රතිසන්ධිය ලබා දුන් අරමුණ අනුවම භවඞග සිත නමින් පවතින බව සඳහන් කිරීමයි. එතැන් පටන් සිහින නොදකින මෙන්ම භවඞගයට බාධා නොකරමින් සිත පවතින සෑම මොහොතකම භවඞගය නදී



සෝතයක් මෙන් අඛණ්ඩව පවතින බව පෙන්වා දී තිබේ.[12] මෙයට අර්ථකතනයක් සපයන විසුද්ධිමග්ග ටීකාව **''උප්පත්තිභවස්ස අඞගභාවේන පවත්තනො ''භවඞගන්ති'' වුච්චති''** උප්පත්ති භවයාගේ නොසිදී පැවැත්මට අඞග වශයෙන් පවතින බැවින් භවඞග යනුවෙන් ව්‍යවහාර කරන බව පෙන්වා දී ඇත.

අභිධර්මය දක්වන පරිදි මරණයට පත්වීමට ආසන්න අවස්ථාවේ දී එනම් මරණාසන්න අවස්ථාවේ දී පහළ වන චිත්ත වීථියට පදනම සපයන්නේ ඔහු විසින් කරන ලද කර්මයන් ය. මෙහි දී අවශ්‍යයෙන්ම මතු භවය ඇති කිරීමේ දී ප්‍රතිසන්ධි (භවඞග) චිත්තය මූලික වන අතර, එය කර්මයක විපාකය හා ඍජුවම සම්බන්ධව පවතී. විසුද්ධිමාර්ගයේ දැක්වෙන පරිදි ගරුක, ආසන්න, ආචින්න සහ කටත්තා යන සතරාකාර කර්මයන් අතරින් මුලින් ම ප්‍රතිසන්ධිය සඳහා බලපානු ලබන්නේ ගරුක හෙවත් බරින් වැඩිම කර්මය යි. ඒවා කුසල, අකුසල භේදය එහි දී දක්වා ඇත. අකුසල ගරුක කර්ම වශයෙන් ආනන්තරීය පාප කර්ම පෙන්වා දිය හැකිය. ගරුක කර්මයක් නොවී නම්, ආසන්න හෙවත් සමීපතම කර්මයක් අවසාන චිත්තවීථියට පදනම සපයයි. එසේ නොමැති නම් බහුල වශයෙන් සිදුකරන ලද අවසාන චිත්තවීථියට පදනම සපයයි. එයද නොමැති නම් බහුල වශයෙන් සිදුකරන ලද "ආචිණ්ණ" හෙවත් බහුල කර්මයක් අවසාන චිත්තවීථියට පදනම් වී උපත සිදුකරයි. එයද නොමැති කල කටත්තා කර්මයක් මුල් වී ප්‍රතිසන්ධිය ලබාදෙන බව පෙන්වා දී ඇත. ගරුක කර්මයේ ඇති බලය පිළිබඳ මෙන්ම කර්මය පුනර්භවය කෙරෙහි එය බලපවත්වන අයුරු අභිධම්මත්ථවිභාවිනී ටීකාව උපමා අනුසාරයෙන් අදහස් ඉදිරිපත් කොට ඇත.[13] ජීවත්ව සිටි කාලයේ කරන ලද කර්මයක් ම ඒ සඳහා හේතු නොවිය හැකිය. ඒ සඳහා කල්ප සියදහසකට පෙර භවයකදී කරන කර්මයක්, කර්ම නිමිත්තක් හෝ ගති නිමිත්තක් වශයෙන් ඉස්මතු විය හැකි බව පෙන්වා දී තිබේ.[14] "කර්ම" යනු තමා විසින් සිදුකරන ලද ප්‍රතිසන්ධිය දීමට තරම් ප්‍රමාණවත් ජනක කර්මයකි. එසේ නැතහොත් කර්මනිමිත්තක් ඇතිවී ඒ අනුව

ප්‍රතිසන්ධිය විය හැකිය. "කර්ම නිමිත්ත" යනු කිසියම් කර්මයක් කිරීමේ දී ඒ සඳහා භාවිත කරන ලද භෞතික උපකරණ හෝ ආධාරක වස්තුවකැ'යි කිවහැක. එසේම "ගති නිමිත්ත" යනු උපදින ස්ථානය, ගතිය මරණයට පෙර දක්නට ලැබීමයි.[15] මේ නිසා මරණාසන්න මොහොතේ දී පිං පොත කියවීමටත්, මල් පහන් දල්වා ගේ දොර පුණ්‍ය භූමියක සිරිය ලබාදීමටත්, පන්සලෙන් සංඝරත්නය වැඩමවා පිරිත් සජ්ඣායනා කරවීමටත් පැරැන්නන් පුරුදු වූයේ මරණාසන්න සිතිවිලි යහපත් කිරීමට අභිධර්මය උගන්වා ඇති බැවිනි. මරණයට පත්වන ඕනෑම පුද්ගලයෙකුට මෙම කරුණු තුනින් එකක් අරමුණු වීම අනිවාර්ය සාධකයක් බව අභිධර්මය දක්වයි. බෝම්බයකට හසු වීම වැනි ක්ෂණික සිදුවීමක දී මිය යන පුද්ගලයෙකුට වුව ද එම අරමුණු වීම් සිදුවන බව තවදුරටත් පෙන්වා දී ඇත. ඒ බව විභඞ්ගට්ඨකථාවේ උදාහරණ සහිතව විග්‍රහ වේ.[16] අවසාන චිත්ත වීථියෙහි භවංග ක්ෂණයේදී වර්තමාන භවය අවසන් කොට චුති චිත්තය ඇති වී නැතිවී යයි. ඉන්පසු අවිජ්ජානුසයා දී තණ්හානුසය මුල්කොට ගෙන රැස්කිරීම් ඇති බැවින් භවයෙහි නැවත ඉපදීම් වශයෙන් ප්‍රතිසන්ධි චිත්තය උපදියි.[17] මෙලෙස මිනිසා තම ජීවිතය සහ පුනර්භවය තීරණය කිරීමේදී ඔහු විසින් සිදුකරනු ලබන කර්මය ප්‍රබල සාධකයක් වන බව පෙනේ. ඒ බව විභඞ්ග අටුවාවේ දී බුද්ධඝෝෂ හිමියන් දක්වන අදහසකට අනුව තහවුරු වේ. මව්කුස පිළිසිඳගත් ගන්ධබ්බයෙකු වර්ධනීය අවස්ථාවට පත් වූ පසු ''අතීතයේ කල්පකෝටි ලක්ෂයකට එහා රැස්කරන ලද, කර්ම දැන් ප්‍රත්‍ය වේ. දැන් රැස්කරන කර්ම අනාගතයෙහි කල්පකෝටි ලක්ෂයක් අවසානයේ ද ප්‍රත්‍ය වේ. පුබ්බේ - අපර වශයෙන් මෙසේ දත යුතුය.[18]

මේ අනුව අතීත කර්ම වර්තමානයටත් වර්තමානයේ රැස්කරන කර්ම අනාගතයටත් ප්‍රත්‍ය වන බව පෙන්වා දී ඇත. අභිධර්ම කෘතීන්හි චුති පටිසන්ධි වශයෙන් දක්වා ඇත්තේ භවාංග විඤ්ඤාණයම බව මෙහි දැකවේ.

මෙලෙස චුති-පටිසන්ධි-භවඞ්ග වශයෙන් පවතින සත්ත්වයකුගේ ජීවිතයේ ප්‍රවෘත්ත කාලය තුළ භවඞ්ගයේ ආයුෂ යම්තාක් වේද,



ඒතාක් බලවත් ආරම්මණයන්හි භවඞ්ග තදාරම්මණ කෘත්‍ය කොට, මරණාසන්න සමයේ දී චුති කෘත්‍ය නිමාකොට භවයෙහි නැවත හටගනියි.[19] ''**අවිච්ඡේදපවත්තිහේතුභාවේන භවස්ස අඞ්ගන්ති භවඞ්ගං**'' යනුවෙන් ''නොසිඳී පැවැත්මට හේතුභාවයෙන් උප්පත්තිභවයාගේ කාරණභාවය තෙමේ භවඞ්ග නම් වේ.'' යනුවෙන් අභිධම්මත්ථවිභාවිනී ටීකාවේ දැක්වේ.[20] එසේම ප්‍රතිසන්ධි අවස්ථාවේ හැඳින්වූ භවඞ්ග සිතම ජීවත්වන කාලය පුරාමත්, පසුව ඔහු මිය යන අවස්ථාවේ දී චුති සිත වශයෙනුත් පැවැත්ම විසුද්ධිමාර්ගය දක්වා තිබේ. එහි සඳහන් පරිදි ''චුතියෙන් මතු නැවත ප්‍රතිසන්ධිය ද, ප්‍රතිසන්ධියෙන් මතු නැවත භවඞ්ගය යැයි මෙසේ ත්‍රිවිධ භවය, පඤ්ච ගතිය, සප්ත විඥානස්ථිය, නවසත්තාවාසය යන මෙතෙක් සැරිසරන්නා වූ සත්වයන්ගේ චිත්ත සන්තතිය නොසිඳ පවත්නේම ය. මේ ලෝකයෙහි යමෙක් අර්හත්වයට පැමිණියේ නම් උන්වහන්සේගේ චුති චිත්තය නිරුද්ධ වූ කල්හි නැවත නූපදනා ලෙස නිරුද්ධ වන්නේම ය.[21] මේ නිසා පුද්ගලයාගේ භවගාමී ජීවිතයේ අවිච්ඡින්න ප්‍රවාහය තහවුරු කිරීම සඳහා භවඞ්ග චිත්ත සංකල්පය අටුවා යුගයේ දී මනා සංවර්ධනයට ලක්ව ඇති බව කිව හැකි ය.

උක්ත අදහස මිලින්ද පඤ්වය තුළ යම් වෙනසකට භාජනය වී විග්‍රහ වන අයුරු දැකගත හැකිය. එහි දී මිළිඳු රජු හා නාගසේන හිමියන් අතර ඇතිවන සංවාදය තුළ භවංග චිත්ත සංකල්පය පුද්ගලයාගේ භවගාමි තත්වය විග්‍රහ කිරීමට යොදාගත් බවක් දක්නට නොලැබේ.

1. ''ස්වාමීනි, නාගසේනයන් වහන්ස, යමෙක් මව්කුසින් උපදන්නේ ය. ඒ උපන්නා වූ සත්ව තෙම මිය යන තැන් දක්වා ඔහුම වේද? නොහොත් අනික් ආකාර කෙනෙක් වේද?''[22]

2. ''තෙරුන් වහන්සේ ඒ අසා 'ඔහුත් නොවෙති'යි අනෙකෙකුත් නොවෙතියි' කී සේක.''[23]

මෙම ප්‍රකාශය තුළින් පුද්ගලයා හා සම්බන්ධ භවගාමී අනන්‍යතාවය පිළිබඳ සැකයෙන් බැලීමට අප යොමුකර ඇති බවක් පෙනේ. ඇතැම්විට මෙම අවස්ථාව නාගසේන හිමියන්ට ද නිශ්චිත පිළිතුරක් දීමට නොහැකි තරමට අසරණ වූ අවස්ථාවකි. මුල් බුදුසමය තුළ මෙම ප්‍රශ්නය ප්‍රමාණවත් තරම් පිළිතුරක් නොවුණා ද විය හැකිය. නාගසේන හිමියන්ගේ මෙම පිළිතුර ප්‍රමාණවත් නොවූ බැවින් රජු නැවත උපමාවක් තුළින් එය පැහැදිලි කරන මෙන් ඉල්ලා සිටියි. එම සාකච්ඡාව කැටිකොට ගත් කල්හි ''දොවන ලද කිරි රයක් ගත වූ පසු දී කිරි ලෙස ද, පසුව එය වෙඬරු බවට ද, පසුව ගිතෙල් බවට ද පත්වන බවත්, එසේ වූයේ මුලින් දොවන ලද කිරිම බවත්, නමුත් විවිධ අවස්ථා අනුව විවිධ නම් ලබන බවත්, ඒවා එකිනෙකට ප්‍රතිබද්ධ බවත්, එපරිද්දෙන් ම **''ධම්ම සන්තති''** හටගන්නා බවත්, ඒ නිසා අනෙකෙක් උපදින්නේ ය, අනෙකෙක් නිරුද්ධ වන්නේ ය යැයි කිවහැකි බවත්, මුලින් ඇති වූ විඤ්ඤාණය ම පශ්චිම විඤ්ඤාණයට යන්නේ ය යැයි[24] පිළිතුරු ලබා දී ඇත. අවස්ථානුකූලව කදිම උපමාවකින් උන්වහන්සේ තම පාණ්ඩිත්‍ය ප්‍රකට කළ ද, පුද්ගලයා සම්බන්ධ මෙම ගැටලුවට එය ප්‍රමාණවත් ආරෝපණයක් නොවුණු බව පැහැදිලි ය. මේ නිසා මෙම ප්‍රශ්නය දීර්ඝ වශයෙන් සාකච්ඡාවට ලක්වන්නට ඇත. මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන් පවසන පරිදි සදාචාරාත්මක වගකීම තහවුරු කරමින්, ඒක පුද්ගලායන ගැටලුව ඉස්මතු වූ නිසා මෙම අදහස තවදුරටත් නිර්මාණය කර ඇති බවයි. මේ නිසා නාගසේන හිමියන් ***''න ච සො න ච අඤ්ඤො''*** යනුවෙන් පවසා ප්‍රශ්නය මගහැර යාමට උත්සාහ දරා ඇති බව ප්‍රකාශකොට තිබේ.[25]

නාගසේන හිමියන් සහ මිළිඳු රජු අතර සිදුවන සංවාදය තුළින් පාලි සාහිත්‍යය තුළ භවඞගය පිළිබඳ පැහැදිලි අදහසක් ප්‍රථමයෙන් විද්‍යමාන වන්නේ මිළින්ද ප්‍රශ්ණයේ බව එදිරිවීර සරත්චන්ද්‍ර මහතා පවසයි.[26] මිළින්ද ප්‍රශ්නය භඞගය පිළිබඳ සාකච්ඡා කරන්නේ ජීවත්ව සිටින පුද්ගලයෙකු සිහින නොදකින ගැඹුරු නින්දේ දී, ඔහුගේ මානසික ස්වභාවය විග්‍රහ කිරීම සඳහා බව පෙනේ. මහා සුපින ප්‍රශ්නය විසඳීමේ දී නාගසේන හිමියන්



භවඞගය පිළිබඳ අභිධර්මාගත විග්‍රහය මනාව ගළපා ඉදිරිපත් කිරීම, භවඞග චිත්තයේ ස්වභාවය පිළිබඳ අභිධම්ම පිටකයට පසු හමුවන පැහැදිලි අවස්ථාවක් ලෙස හඳුනාගත හැකිය. භවඞගය පිළිබඳ සංවාදයට මාතෘකා වූයේ (1) මිළිඳු රජු විසින් (2) නාගසේන හිමියන්ගෙන් නගන පැනය යි.

1. ''ස්වාමීනි, නාගසේනයන් වහන්ස, යමෙක් ස්වප්න දක්නේ වී නම්, මේ තෙම නිදිමත වෙමින් දක්නේ ද? නොහොත් නිදිවර්ජිත වෙමින් දක්නේ ද?[27]

2. ''මහරජාණෙනි, යම් පුරුෂයෙක් ස්වප්න දක්නේ ද, ඒ පුරුෂ තෙම නිදිමත වෙමින් නොදක්නේ ය. නිදිවර්ජිත වෙමිනුත් නොදක්නේ ය. කපි නිද්‍රාවට පැමිණියහුගේ චිත්තය කැදැල්ලට වන් පක්‍ෂියකු මෙන් භවඞගගත වන්නේ ය. හෘදය වස්තුව නිසා පවතින්නා වූ ඒ භවඞගගත චිත්තය කිසිවක නොපවත්නා චිත්තය කිසි සැප දුකක් නොම දන්නේ ය. සුවදුක් විභාග නොදන්නා චිත්තයට ස්වප්න අරමුණෙක් නොවන්නේ ය. සුවදුක් ආදියෙහි චිත්තය පවත්නා කල්හිම ස්වප්න නොපෙණෙන්නේ ය.[28]

පුද්ගලයෙකු නිදන අවස්ථාවේ දී සිහින දැකීමට හේතු[29] පැහැදිලි කරන නාගසේන හිමියන් සිහින නොදකින ගැඹුරු නින්ද යනු මනස භවඞග ගතවීමක් ලෙස දක්වා තිබේ. ඒ තුළින් භවඞගය පිළිබඳ අභිධර්ම පිටකයට වඩා යම් පමණක සංවර්ධනයක් මිළින්ද ප්‍රශ්නය තුළින් හඳුනාගත හැකි වේ. අනෙක් අතින් ගත්විට භවඞගය පිළිබඳ සංක්ලපය තුළින් පුද්ගලයාගේ තාවකාලික මරණයට පත් අවස්ථාවක් වශයෙන් සැළකෙන තද නින්ද සහිත අවස්ථාව තුළ ගැමි වහරේ එන ''මර නින්ද'' වැනි කියමන්වලින් අර්ථ ගැන්වෙන්නේ ද මරණයට නොදෙවෙනි සේ පුද්ගලයා ගැඹුරු නින්දක සිටින බවකි. මේ නිසාම මරණයේ දී පුද්ගලයාගේ අවිච්ඡින්න ජීවන ප්‍රවාහය විග්‍රහ කිරීමට භවඞගය මනාව ගළපා ගැනීමට ඉඩකඩ සැකසුණු බව සිතිය හැකිය. මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍රයන් එම අදහස

තහවුරු කරයි. (මිළින්ද ප්‍රශ්නයේ සඳහන් භවඞග අවස්ථාවෙන් පසු) බුද්ධඝෝෂ හිමියන්ගේ පටන් පහළට අනුගාමිකයන් විසින් ශාස්වත හා උච්ඡේද දෘෂ්ටීන්ට නොඑළඹ පුද්ගලයාගේ භවගාමී ජීවිතය තහවුරු කර පෙන්වීමට භවඞග චිත්තය මැනවින් භාවිත කළ බව පෙන්වා දී තිබේ.[30]

සිහිනය සම්බන්ධයෙන් භවඞග චිත්තය පිළිබඳ විග්‍රහය විසුද්ධිමාර්ගය තුළ ද සාකච්ඡා වන අතර, එහි දී සිහින නොදකින ගැඹුරු නිදිගත් අවස්ථාවේ දී මෙන්ම භවඞග ධාරාවට බාධාකරමින් වෙනත් සිතක් ඇති නොවන අවස්ථාවන්හි දී ද භවඞග චිත්තය අනවරතව නදී සෝතයන් මෙන් පවතින බව දක්වා ඇත.[31]

නින්ද යනු චිත්තය භවඞග ගතවීම බව පැහැදිලි ය. එසේ නින්දට පත්වන කල්හි මනොද්වාරික චිත්තවීථියක් ඉපිද ඉන්පසු භවඞග ප්‍රප්ත වේ. කිසි විටෙක පඤ්චද්වාරික චිත්ත වීථිවලින් නින්දට නොපැමිණේ. නින්දෙන් පිබිදෙන කල්හි, මනෝද්වාරික චිත්තවීථියකින් ම පිබිදේ. එසේ නින්දට වැටී සිටින විට සිහින නොපෙනේ. එය සමන්තපාසාදිකා විනය අටුවාව මෙසේ දක්වයි.

> "කිමෙක් ද, ඒ සිහින දකින කල්හි එය නිදාසිටිය දී දකී ද? පිබිදී සිටියදී දකී ද? නැතහොත් නොනිදන්නේ නොම පිබිදුනේ දකී ද? කීම එහි ද නිදාසිටිය දී සිහින දකීනම් අභිධර්ම විරෝධී වේ. භවඞග චිත්තයෙන්ම නිදන්නේ වෙයි. ඒ භවඞග චිත්තයට රූප නිමිති ආදි ආරම්මණයක් හෝ රාගාදි සම්ප්‍රයුක්ත ධර්මයක් හෝ නොවෙයි. සිහින දකින්නහුට මෙබඳු සිත් උපදී. ඉක්බිති පිබිදී සිටියදී සිහින දකීනම් විනය විරෝධී වේ. එබැවින් නොනිදන්නේ නොපිබිදී සිටියේ සිහින දකී."[32]

අභිධර්මය අනුව ස්වප්න දකින පුද්ගලයා ද මනෝද්වාරික චිත්තවීථියකින්ම ස්වප්න දකී. වරින්වර නිදමින් පිබිදෙමින් ගතවන අවස්ථාව (කපිමිද්ධා) කපිනින්ද හෙවත් වඳුරු නින්ද



යැයි මිළින්ද ප්‍රශ්නයේ පෙන්වා දී තිබේ. මෙම කපි නින්දේදී අශෛක්ෂයන් හැර, ශෛක්ෂ පෘථුජ්ජන පුද්ගලයෝම ස්වප්න දකිති. මෙසේ සිහින දක්නා කල්හි මනොද්වරික චිත්තවීථියක් පහළ වී කුසලාකුසල ජවනයන් ද ඇතිවිය හැකිය. එවිට කාමාවචර මනොද්වාරිකක චිත්තවීථි තදාරම්මණ ඇතිව හෝ නැතිව හටගන්නා අතර, ඇතැම්විට ජවන, තදාරම්මණ නූපදනා දුර්වල ස්වප්න දක්නා මනොද්වාරික චිත්තවීථි පහළවන කල්හි, මනොද්වාරාවජ්ජන සිත දෙතුන් වරක් ඉපිද නිරුද්ධ භවංගපාතය වේ. එසේ උපදනා මනෝ ද්වාරික චිත්තවීථීන්හි ඇතිවන කුසලාකුසල ජවනයෝ ඉතා දුර්වල බැවින් ප්‍රවෘත්ති විපාක පමණක්ම ගෙනදෙන බව අභිධර්මාර්ථ ප්‍රදීපිකාවේ හතරවන පරිච්ඡේදයේ ස්වප්න හා නිද්‍රා පරිච්ඡේදයේ දී පෙන්වා දී තිබේ. මේ අනුව ගත්කල සිහින දකින්නේ නින්දත් නොනින්දත් අතරදී වන අතර, එයින් කුසල අකුසල කර්මයෝ රැස්වේ. නමුදු ඒවා ප්‍රවෘත්ති විපාක පමණක් ගෙනදෙන දුබල කර්මයෝ බව පෙන්වා දී ඇත.

මීට අමතරව භවංග චිත්තයේ භෞතික සම්බන්ධය පිළිබඳව ද අට්ඨකතා සාහිත්‍ය තුළ හා පෙඨක ග්‍රන්ථ තුළ සාකච්ඡාවට ලක්ව ඇති අයුරු දැකගත හැකි වේ. විශේෂයෙන් මිළින්ද ප්‍රඥ්හය තුළ භවඞග චිත්තය පුද්ගලානුබද්ධ නම් එය ශරීරයේ කොහි පිහිටන්නේ ද යන්න පිළිබඳ සංවාදයන් දක්නට ඇත.[33] එසේම විසුද්ධි මාර්ගයේ ද මේ පිළිබඳ දීර්ඝ විස්තරයක් දක්නට ඇත. එහි දී භවඞග චිත්තය හෘදය වස්තුව ආශ්‍රය කරගෙන පවතින බව දක්වා ඇත. "**හදය වත්‍ථු නිස්සිතා භවඞ්ග සන්තති**"යනුවෙන් ඒ බව දක්වා ඇත. එහි අර්ථය වන්නේ හෘදය වස්තුව ආශ්‍රය කරගනිමින් භවඞග සන්තතිය ක්‍රියාත්මක වන බවයි. එමෙන් ම අභිධර්මාර්ථ සංග්‍රහයට ලියන ලද විවරණ කෘතිය වන අභිධම්මත්‍ථවිභාවිනී ටීකාව ද භවඞග චිත්තය හෘදය වස්තුව ඇසුරුකොට පවතින බව දක්වා ඇත.[34] "***හදයවත්‍ථුමහිවලිතෙ තන්නිස්සිතස්ස භවඞගස්ස චලනාකාරෙන පවත්ති හොති***" "හෘදය වස්තුවෙහි සෙලවීමෙන් එය උපනිශ්‍රිතව පිහිටා ඇති භවඞගයාගේ සෙලවීම් ආකාරයෙන් පවතී" යනු එහි අර්ථය යි.

''හදයවත්‍ථුපදට්ඨානා'' යනුවෙන් අභිධම්මාවතාරයෙහි ''මනො, විඤ්ඤාණධාතු යන මේ දෙක හෘදය වස්තුව ඇසුරු කොට පවතින බව දක්වා ඇති අතර, එයින් විඤ්ඤාණ ධාතුව මඟින් ප්‍රතිසන්‍ධි, භවඞග සහ චුති කෘත්‍ය සිදුකරන බව ද දක්වා තිබේ.[35] මේ පිළිබඳ බටහිර අර්ථකතනයන් ද දක්නට ඇත. බටහිර පිළිගත් අදහස වන්නේ සිත මොළය ආශ්‍රිතව පිහිටා ඇති බවයි. කෙසේ නමුත් භවඞග සිතට භෞතිකමය පදනමක් ද පවතින බව මෙයින් පැහැදිලි වේ.

මේ ආදී ලෙස ථෙරවාදී සම්ප්‍රදායානුගත අට්ඨකතා සාහිත්‍ය තුළ මෙන්ම පසුකාලීන ථෙරවාදී දාර්ශනික මූලාශ්‍රය තුළ විග්‍රහ වන්නා වූ මෙම භවඞග චිත්ත සංකල්පයයෙහි මූලාශ්‍රයක් හෙවත් මූලබීජ පිළිබඳ සැළකීමේ දී ආදි බුදුදහමේ දක්නට ඇති නොයෙකුත් සූත්‍ර දේශනා ඒ සඳහා පදනම් වී ඇති අයුරු දැකගත හැකිය. අට්ඨකතා සාහිත්‍ය තුළ මෙන්ම ආභිධම්මික ඉගැන්වීම් තුළ මෙම භවඞග චිත්ත සංකල්පය සංවර්ධනය වී පෝෂණය වූවා යැයි ද, ආදි බුදුසමය තුළ උක්ත සංකල්පය පිළිබඳ ඍජු දේශනාවක් දක්නට නොලැබෙන බව ඉහත දැක්වූ නමුදු, එහි ඡායාමාත්‍ර හෝ ඒ සඳහා යම් සමානකමක් ඇති ඉගැන්වීම් ආදි බුදුදහමෙන් සොයාගත හැක. පසුකාලීන ථෙරවාදී දාර්ශනික චින්තනයන් තුළ මෙන්ම නිකායාන්තර බුදුසමය තුළ ද නිර්මාණය වූ සියලු දාර්ශනික ඉගැන්වීම් විෂයෙහි ආදි බුදුසමයෙන් මූල බීජ පදනම් වූ බව බොහෝ උගතුන්ගේ මතය යි.[36] නෛයානිකවරු කිසිදු අවස්ථාවක බුද්ධ වචනය ඉක්මවා යමින් තම සම්ප්‍රදායානුගත ඉගැන්වීම් දක්වන බව සඳහන් නොකළහ. මේ අනුව ථෙරවාදී භවඞග චිත්ත සංකල්පයට ද මූල බීජ වූ ආදි බෞද්ධ ඉගැන්වීම් කිහිපයක් හඳුනාගත හැක.

මුල් බුදුසමයේ එන ඉගැන්වීම් අතර ''භව'' යන්නෙහි වචනාර්ථ වන්නේ ''පහළවීම'' යන්න යි. එහි දාර්ශනික අර්ථය දක්වන්නේ සත්වයාගේ විවිධ භවයන්හි ඉපදෙමින් මැරෙමින් ගතකරනු ලබන ජීවිතය විග්‍රහ කිරීමය. ඒ නිසාම බුදුරදුන් පටිච්චසමුප්පාද දේශනාවේදී *''උපාදාන පච්චයා භවො''* යනුවෙන් භවය නිර්මාණය වීම තුළින් උපත සිදුවන බව දක්වා



තිබේ. නැවත නැවත ඉපදීමට හේතු වූයේ භවයට පැමිණීම නිසා ය. ඒ නිසා ***''සත්තො සංසාරමාපාදි''*** යනුවෙන් ප්‍රකාශ වේ.[37] ඒ නිසා පටිලෝම වශයෙන් ***''ජාති නිරොධා භව නිරොධො''*** යනුවෙන් දක්වා ඇත. භවය අවසන් කිරීමෙන් පසු නිර්වාණයට පත්වන බව මුල් බුදුසමයෙහි ඉගැන්වීමයි.***''භව නිරොධො නිබ්බාණන්ති''***[38] මේ නිසා භවය හා සම්බන්ධ පුද්ගලයාගේ භවයෙහි අවිච්ඡින්නතාවය තහවුරු කිරීමේදී මුල් බුදුසමය තුළම ''භව'' යන්නට ''සෝත'' යන පදය එක්කොට ***''භවසෝත''***[39] වැනි වචන භාවිත කොට ඇත. එහි අදහස වන්නේ ''සංසාර ගංගාව'' වැන්නකි. එහෙත් පසුකාලීනව බෞද්ධ දර්ශන ප්‍රවාහය තුළ පුද්ගලයාගේ භවගාමී ජීවිතය විග්‍රහ කිරීමට, මුල් බුදුසමයාගත මෙම පුරුදු වචන කිහිපය පසුකාලීනව ක්‍රමානුකූලව සංවර්ධනය කරන්නට ඇතැයි සිතිය හැකිය. මූලික බුද්ධ දේශනාව තුළ සිත පිළිබඳ සඳහන් වන්නේ වහා වෙනස්වන සුළු තත්වයක් ලෙස බැවින්, ස්ථිර වූ සිතක පැවැත්ම නිතැතින්ම ප්‍රතික්ෂේප වී ඇත. එහෙත් පසුකාලීනව පුද්ගලයාගේ භවගාමී ජීවිතය පැහැදිලි කර දැක්වීමේ අවශ්‍යතාවය පැන නැගුණි. ඒ සඳහා භවඞග චිත්තය වැනි සංකල්පයක් නිර්මාණය කරන්නට ඇත්තේ, මුල් බුදුසමයේ මග පෙන්වීම යටතේ විය යුතු ය. එය තහවුරු වන අවස්ථාවක් ***''විඤ්ඤාණසෝත''***[40] යන වචන තුළින් ප්‍රකට වේ. එයින් දැක්වෙන්නේ ද ''විඤ්ඤාණ ගංගාව'' වැනි අර්ථයකි. ''සෝත'' යන වචනය නිතැතින් ම ගලායාම යන අර්ථයෙන් දක්වා ඇති බව පෙනේ. ඒ අනුව විඤ්ඤාණය ගංගාවක් මෙන් ගලායන බව මෙයින් ප්‍රකට වේ. පසුකාලීන අටුවා යුගය තුළමෙම ආභාසය ඍජුවම හෝ වක්‍රව ලබාගෙන භවඞග චිත්ත සංකල්පය දක්වා සංවර්ධනය කොට ඇතැයි කිව හැකිය.

භවඞග චිත්තය වැනි සංකල්පයක ස්වභාවය පෙන්නුම් කෙරෙන මූලික සූත්‍ර ගණනාවක් උගතුන් පෙන්වා දී තිබේ. එනම්, දී.නි. නිදාන සූත්‍රය, ම.නි. මහාහත්ථිපදෝපම සූත්‍රය, මහාතණ්හාසඞඛය සූත්‍රය, මහා සච්චක සූත්‍රය, සං.නි. බීජ සූත්‍රය, සමණබ්‍රාහ්මණ සූත්‍රය, සම්භෙජ්ජඋදක සූත්‍රය, විපස්සි සූත්‍රය,

අං.නි. චක්ක නිපාතයේ, පඨම පණ්ණාසකයේ බොහෝ සූත්‍ර මෙහි දී පෙන්වා දී තිබේ.[41] මෙම සූත්‍රයන් හි බොහෝ විට විග්‍රහ වී ඇත්තේ පුද්ගලයා සම්බන්ධ භෞතික හා මානසික, විශ්වීය තත්ත්වයන් හි බලපෑම පිළිබඳව ය.

අභිධර්මය උගන්වන්නේ චිත්ත, චෛතසික, රූප, නිබ්බාණ යන සතර පරමාර්ථ ධර්මයන් ය. මුල් බුදුසමයේ සූත්‍රාගත චිත්ත, මනෝ, විඤ්ඤාණ පිළිබඳ දේශනාවන් අභිධර්ම පිටකය තුළ එකම නමකින් හඳුන්වා ඇත්තේ "චිත්ත" වශයෙනි. මේ නිසා චිත්ත පරමාර්ථය පිළිබඳ විද්වත් කතාබහ විවාදාපන්න වී තිබේ. ''මනො'' (භවඞග) යනුවෙන් පිරිසිදු මනස දැක්විය යුතු තැන්වලදී පවා චිත්ත යනුවෙන් විග්‍රහ කිරීමට යාමේදී ගැටලු ඇති වී ඇති බව හේන්පිටගෙදර ඤාණසීහ හිමියන් පෙන්වා දී තිබේ. උන්වහන්සේ දක්වන පරිදි භවඞග චිත්තය සඳහා උප්පාද, ඨිති, භඞග යන ලක්ෂණ තුන ආරෝපණය කිරීමේ වරද නිසා බුදුදහමේ නිර්වාණය ශූන්‍යතාවාදයක් බවට පත්වී ඇත.

එකම භවඞග චිත්තයෙහි ස්වභාවයන් තුනක් පවතී. එය යෙදෙන පරිසරය අනුව විවිධ වේ. මිනිසෙකුගේ උපතේදී ''ප්‍රතිසන්ධි චිත්තය'' යනුවෙන් ද, ජීවත්වන කාලයේ දී ''භවඞග චිත්තය'' වශයෙන් ද, මරණයට පත්වීමේ දී ''චුති චිත්තය'' යනුවෙන් ද විවරණය කොට තිබේ. භවඞග චිත්ත සංකල්පය මුල් බුදුසමයට අයත් නොවුණ ද, මුල් බුදුසමයේ එවැනි ඉගැන්වීමක් නිර්මාණය වීමට ඉඩකඩ බොහෝ තිබූ බව සූත්‍ර දේශනාවන්හි එන ව්‍යාංගාර්ථවලින් දක්නට ඇත. එහිලා නිදසුනක් වශයෙන් ම. නි. මහා වේදල්ල සූත්‍රය පෙන්වා දිය හැකිය. එහි සඳහන් කොට්ඨිත හිමියන් සහ ශාරිපුත්ත හිමියන්ගේ සංවාදය භවඞග චිත්තය සම්බන්ධයෙන් වැදගත් වේ. කොට්ඨිත හිමියන් සැරියුත් හිමියන්ගෙන් නගන පැනය වන්නේ කලුරිය කළ පුද්ගලයා සහ සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්තියට සමවැදුණු පුද්ගලයා අතර ඇති වෙනස කුමක් ද? යන්නයි.[42] එයට පිළිතුරු දෙන සැරියුත් හිමියන්ගේ අදහස මෙසේ ය.

"මියගිය පුද්ගලයාගේ ආශ්වාස ප්‍රාස්වාස කිරීම හෙවත් කායසඞකාර සන්සිඳී ඇත. විතර්ක, විචාර හෙවත් වචීසඞඛාර

18 OCT 2017



සන්සිඳී ඇත. සංඥා, වේදනා හෙවත් චිත්තසඞකාර සන්සඳී ඇත. ආයුෂය අවසන් වී ඇත. ශරීරයෙහි උණුසුම සන්සිඳී ඇත. ඉන්ද්‍රිය ශක්තිය විනාශ වී ඇත. සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්තියට සමවැදුණු භික්ෂුවගේ කායසඞඛාර සංසිඳී ඇත. වචීසඞඛාර සංසිඳී ඇත. චිත්තසඞඛාර සංසිඳී ඇත. ආයුෂය අවසන් නොවුයේ වෙයි. උණුසුම නොසන්සිඳුණේ වෙයි. ඉන්ද්‍රිය ශක්තිය නොනැසුණේ වෙයි."[43]

මේ අනුව මරණයට පත් පුද්ගලයා හා නිරෝධ සමාපත්තියට සමවැදුණු පුද්ගලයාගේ වෙනස පැහැදිලි ය. ආයුෂය, උණුසුම, ඉන්ද්‍රිය යන තුන නොනැසී තිබීම හෝ විනාශ වී තිබීම මෙම අවස්ථා දෙකෙහි පෙනෙන ලක්ෂණය යි. මෙහි දී නිරෝධ සමාපත්තියට සමවැදුණු භික්ෂුව නැවත එම සමවතින් නැගී සිටින කල නැවත සිත ක්‍රියාකාරී වේ. එසේ ඔහු විසින් නැගී සිටීමට නම් සිතක් ඉපදවීමේ ශක්තිය තිබිය යුතුය. නැතහොත් ඔහුට එම සමවතින් නැගී සිටීමට හැකියාවක් නැත. ආයු, උණුසුම හා ඉන්ද්‍රිය ශක්තිය යන මේ තුනෙන් පැහැදිලිවම ආයු සහ ඉන්ද්‍රිය (''***ආයූති ජීවිතින්ද්‍රියං***'' - ආයුෂය යනු ජීවිතින්ද්‍රිය යි) යන දෙකට සිතක් පහළ කළ නොහැකි බව පිළිගැනේ. ඉතිරි වන්නේ උණුසුම පමණි. එසේ නම් එම උණුසුම සාමාන්‍ය උණුසුමක් නොවිය යුතු ය. මෙය අටුවාව විස්තර කර ඇත්තේ ***''කම්මජ තෙජොධාතු'' (උස්මාති කම්මජතෙජොධාතු)*** වශයෙනි. එහි අර්ථය වන්නේ ''කර්ම බලවේගයෙන් උපන් උණුසුම'' යන්නයි.[44] සත්ත්වයෙකු මුලින් ම මව්කුස පිළිසිඳ ගැනීමේදී මුලින් ම ඇතිවන්නේ මෙම උණුසුම් හෙවත් කර්මජ තේජෝ ධාතුව යි. හේන්පිටගෙදර ඤාණසීහ හිමියන්ගේ අදහස අනුව මෙම උණුසුම යනු භවඞග චිත්තය විය හැකිය.[45] එය පුද්ගලයාගේ අවිච්ඡින්න බව ආරක්ෂා කරන අතර, ඔහුගේ භවගාමී ජීවිතයේ වාර්තාව ලෙස සැළකිය හැකි ය. මන්ද එය පුනර්භවය ඇති කිරීමේ දී මූල සාධකය වන බැවිනි.

මජ්ඣිම නිකායේ මහාතණ්හාසඞඛය සූත්‍ර දේශනාව පිළිබඳ අවධානය යොමු කිරිමේදී සාති නම් භික්ෂුවක් විසින් සදාකාලික වූ, නොවෙනස් වූ, අවිනාශී වූ, විඤ්ඤාණයක් ඇතැයි ද, එය

භවයෙන් භවයට රැගෙන යන බව ද පිළිගත් බව දැක්වේ. එහිදී බුදුරදුන් සාති භික්ෂුවට ගර්හා කොට පටිච්චසමුප්පන්න වූ විඤ්ඤාණය වටහා ගන්නා ලෙස දේශනා කොට තිබේ.[46] මෙයින් පැහැදිලි වන්නේ පසුකාලීනව උද්ගත වූ ගැටලුවලට පිළිතුරු සෙවීමේ දී ශාස්වත හා උච්ඡේද දෘෂ්ටීන්ට නොවැටී භවංග චිත්ත සංකල්පය සංවර්ධනය කිරීමට මෙම මඟ පෙන්වීම උපකාරී වන්නට ඇති බවයි.

මහානිදාන සූත්‍රයේ සඳහන් වන පරිදි ***"සංඛාර පච්චයා විඤ්ඤාණං"*** යන්න විග්‍රහ කිරිමේදී පැහැදිලි වන්නේ මෙම විඤ්ඤාණය යනු ම.නි. මහාතණ්හාසඞ්ඛය සූත්‍රයේ දැක්වෙන මව්කුස දරුවකු පිළිසිඳ ගැනීමට අදාළ ප්‍රධාන කාරණයක් වන ***"ගන්ධබ්බො ච පච්චුප්පට්ඨිතො හොති"*** යන ගන්ධබ්බයකුගේ පැමිණීම හෙවත් "ප්‍රතිසන්ධි විඤ්ඤාණය" බව උගතුන් දක්වයි.[47] ප්‍රතිසන්ධි විඤ්ඤාණය යනු භවඞග සිතම ය. මේ නිසා චුති පටිසන්ධි අතර කාලය තුළ එක් සත්ත්වයෙකුගේ අතරතුර ජීවිතයේ ස්වරූපය කෙසේදැයි වච්ඡගොත්ත නගන ලද ප්‍රශ්නයට බුදුරජාණන් වහන්සේ පිළිතුරු දුන් අවස්ථාවක් සං.නි. වච්ඡගොත්ත සූත්‍රයේ දී දක්නට ලැබේ.

> "වච්ඡය යම් කලෙක මේ කයත් අත්හරීද? සත්ත්‍වයා වෙනත් කයකටත් නොගියේ වෙයිද? මම ඔහු තණ්හා උපාදානය ඇත්තෙක් කොට කියමි. වච්ඡය, තණ්හාවෙන් යුක්ත වූවහුට ඒ අවස්ථාවෙහි උපාදානය වෙයි."[48]

මේ අනුව චුති සහ පටිසන්ධි අතර පුද්ගලයෙකු සිටී නම් ඔහුගේ ස්වරූපය ලෙස දක්වා ඇත්තේ තණ්හාව උපාදානය නිසා ඔහුගේ පැවැත්ම සිදුවන බවයි. ***(තණ්හාපච්චයා උපාදානං උපාදාන පච්චයා භවො)*** මෙවැනි අවස්ථාවන් තුළින් භවඞග චිත්ත සංකල්පයට පදනම සැපයූ බව පෙන්වා දිය හැකිය.

මුල් බුදුසමයාගත තවත් වැදගත් විග්‍රහක් වශයෙන් පෙන්වා දිය හැකි අවස්ථාවක් උගතුන් අතර විවාදයට තුඩු දී ඇති බව පෙනේ. අංගුත්තර නිකායේ එන,



> ***"චත්තාරිමානි. භික්ඛවේ, අග්ගානි, කතමානි චත්තාරි? රූපග්ගං, වෙදනාග්ගං, සඤ්ඤාග්ගං. භවග්ගං ඉමානි ඛො, භික්ඛවෙ, චත්තාරි අග්ගානීති"***[49]

යන ප්‍රකාශය තුළින් භවඞගය යන්න මුල්වරට මූලික සූත්‍ර දේශනාවක සඳහන් වන බව ඇතැම් උගතුන් සඳහන් කරයි. එහෙත් ඇතැමෙක් එය වැරදි වැටහීමක් ලෙස සඳහන් කරන අතර, ඇතැම් උගතුන් භවඞග යන්න ප්‍රථමයෙන් ම යෙදී ඇත්තේ පට්ඨානයෙහි බව දක්වා තිබේ.[50] මුල් බුදුසමයාගත තවත් වැදගත් විග්‍රහයක් ලෙස සංයුක්ත නිකායේ බීජ සූත්‍රය[51] උගතුන් පෙන්වා දී ඇත. එහි සඳහන් පරිදි අඛණ්ඩ වූ, නොනැසී පවතින්නා වූ විඤ්ඤාණ බීජ පහක් පිළිබඳ දැක්වේ.

> ***"පඤ්චිමානි, භික්ඛවේ, බීජජාතානි, කතමානි පඤ්ච? මූලබීජං, ඛන්ධබීජං, අග්ගබීජං, ඵලුබීජං, බීජබීජඤ්ඤෙව පඤ්චමං ඉමානි චස්සු භික්ඛවෙ පඤ්ච බීජජාතානි අඛණ්ඩානි අපූතිකානි අවාතාතපහතානි සාරාදාන."***

මූල බීජ, ඛන්ධ බීජ, අග්ග බීජ, ඵලු බීජ සහ බීජබීජ යනුවෙන් දැක්වෙන බීජ. එය වැඩිවීමට අවැසි පසුබිමක් නොවූ විට වැඩීමට පත් නොවේ. එසේ ම පඨවි ධාතුව අවබෝධ කරගතයුතු වන්නේ සතරාකාර වූ විඤ්ඤාණස්ථාන වශයෙනි. එසේම ආපෝ ධාතුව තණ්හාව සහිත විඤ්ඤාණ ධාතුව අවබෝධ කරගත යුතු ය. යම් රූපාරම්මණයක් විඤ්ඤාණය හා ගැටීමෙන් පසු එයට තෙතමනය වූ නන්දිරාගය ***(නන්දූපසේචනං)*** ලැබෙන විට එය විපුලත්වයට පැමිණෙන බවත්, එය විඤ්ඤාණයේ ආහාරය බවත් දක්වයි. රූපය නැමැති විඤ්ඤාණය බීජය පැවත්වීමට බලපාන භූමිය වන්නේ රූප, වේදනා, සඤ්ඤා, සඞ්ඛාර යන සතර විඤ්ඤාණ භූමීන් ය. එය වර්ධනය වන්නට තෙතමනය නැමති තණ්හාව තිබිය යුතු ය. ඒ තුළින් ඇතිවන බීජයන් සංවර්ධනය වීම නිසා ප්‍රතිසන්ධි දීමට පැමිණේ. එහෙත් යමෙක් එම රූපාරම්මණාදිය ඇති වූ වහාම එය අවබෝධ කරගන්නේ නම්

එය වෘද්ධිය පත් නොවේ. මෙම සූත්‍රය තුළ එන විඤ්ඤාණ බීජයන්ගේ වැඩියාම පිළිබඳ සඳහන බොහෝ දුරට භවඞග චිත්ත සංකල්පය කෙරෙහි මූලබීජ සැපයූ බව පෙන්වාදිය හැකි ය.

මෙසේ අංගුත්තර නිකාය තුළ භවඞග සංකල්පයේ ඡායාමාත්‍ර බොහෝ විට හඳුනාගත හැකිය. නාමරූපයට පටිසන්ධි විඤ්ඤාණයේ බැසගැනීම (ඔකන්ති) පිළිබඳ සටහන වැදගත් අවස්ථාවකි. එම බැසගැනීම පටිසන්ධි විඤ්ඤාණය ලෙස නම් කර තිබීම ද සැළකිල්ලෙන් විමසිය යුතු අවස්ථාවකි. එසේම එහි ''කම්මභව'' යන්න ද ව්‍යවහාර වී තිබේ.[52] මේ නිසා භවඞග චිත්ත සංකල්පය සංවර්ධනය වීමේ දී මෙම ඉගැන්වීම බෙහෙවින් ම බලපාන්නට ඇති බව උගතුන්ගේ අදහසයි.[53]

## ආන්තික සටහන්

1. පච්ඡිමානං පච්ඡිමානං විපාකබ්‍යාකතානං කිරියාබ්‍යාකතානං ඛන්ධානං උපනිස්සය පච්චයෙන පච්චයො භවංගං ආවජ්ජනාය කිරියං වුට්ඨානස්ස අරහතො අනුලොමං ඵලසමාපත්තියා පට්ඨානස්සුප්‍රකරණ පාළි I, පි. 118.
2. අසේඛාති පංචින්ද්‍රියානි සංඛාර පරියාපන්නානි යෙ සංඛතා නො ච භවංගා. නෙත්තිප්ප්‍රකරණ පාළි, පි. 96.
3. සායෙව විජ්ජා සංඛාර පරියාපන්නානි යෙ සංඛතා නො ච භවංගං -එම.
4. මිළින්ද පඤ්හ, ආනඳ මෛත්‍රී සංස්කරණය, 36 පිට.
5. මිළින්ද පඤ්හ, ආනඳ මෛත්‍රී සංස්කරණය, 261-262 පිටු.
6. ඔදහනකාරකො උපායාසො, සො භවස්සපදට්ඨානං ඉමාපි භවඞගානි සදා සමග්ගානි නිබ්බත්තාති භවන්තිසො භවො තං සංසාරස්ස පදට්ඨානං. නෙත්තිප්ප්‍රකරණ, පි. 48.
7. නනුමයා මොඝපුරිස අනෙක පරියායෙන පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං වුත්තං අඤ්ඤත්‍ර පච්චයා නත්ථි විඤ්ඤාණස්ස සම්භවො. ම.නි., මහාතණ්හාසංඛය සුත්ත, බු.ජ.මු., පි. 606.
8. the bhavanga-citta is same type of citta as patisandhicitta. There are nineteen types of patisandhi-citta and thus there are nineteen types of patisandhi-citta. Gorkom, Nina van, Abhidhamma in Daily Life.117 pg.



9. කථං? යදාහි අට්ඨන්නං කාමාවචරකුසලානං ආනුභාවෙන දෙවමනුස්සෙසු සත්තා නිබ්බත්තන්ති, තදා තෙසං මරණකාලෙ පච්චුපට්ඨිතං කම්මකම්මනිමිත්තගතිනිමිත්තානං අඤ්ඤතරං ආරම්මණං කත්වා.. වි.ම. ඛන්ධ නිද්දේසය, පි. 566.
10. එවං තාවෙත්ථ එකූනවීසතියා විපාකවිඤ්ඤාණානං පටිසන්ධිවසෙන පවත්ති වෙදිතබ්බා. වි.ම. ඛන්ධ නිද්දේසය, පි. 548.
11. අභි. තා. පි. 121.
12. පටිසන්ධිවිඤ්ඤාණෙ පන නිරුද්ධෙ තං තං පටිසන්ධිවිඤ්ඤාණ මනුබන්ධමානං තස්ස තස්සෙව කම්මස්ස විපාකභූතං තස්මිඤ්ඤෙව ආරම්මණෙ තාදිසමෙව භවඞගවිඤ්ඤාණං නාම පවත්තති. පුනපි තාදිසන්ති එවං අසති සන්තානවිනිවත්තකෙ අඤ්ඤස්මිං චිත්තුප්පාදෙ නදීසොතං විය සුපිනං අපස්සතො නිද්දොක්කමනකාලාදිසු අපරිමාණසඞ්ඛ්‍යම්පි පවත්තතියෙවාති එවං තෙසඤ්ඤෙව විඤ්ඤාණානං භවඞගවසෙනාපි පවත්ති වේදිතබ්බා. වි.ම. ඛන්ධ නිද්දේසය, පි. 566.
13. එවං තාව විපාකදානකාලවසෙන චතුබ්බිධං දස්සෙත්වා ඉදානි විපාකදානපරියායතො, කිච්චතො ච චතුබ්බිධතං දස්සෙතුං ගරුකන්තිආදි වුත්තං තත්ථ ගරුකන්ති මහාසාවජ්ජං, මහානුභාවඤ්ච අඤ්ඤෙන කම්මෙන පටිබාහිතුං අසක්කොණෙය්‍යකම්මං බහුලන්ති අභිණ්හසො කතං, එකවාරං කත්වාපි අභිණ්හසමාසෙවිතඤ්ච. ආසන්නන්ති මරණාසන්නකාලෙ අනුස්සරිතං, තදා කතඤ්ච. කටත්තාකම්මන්ති ගරුකාදිභාවං අසම්පත්තං කතමත්තතොයෙව කම්මන්ති වත්තබ්බකම්මං තත්ථ කුසලං වා හොතු අකුසලං වා, ගරුකාරුකෙසු යං ගරුකං මාතුඝාතකාදිකම්මං වා මහග්ගතකම්මං වා, තදෙව පඨමං විපච්චති. තථා බහුලාබහුලෙසු යං බහුලං සුසීල්‍යං දිස්සීල්‍යං වා, තදෙව පඨමං විපච්චති, චිරාසන්නෙසු යං ආසන්නං මරණකාලෙ අනුස්සරිතං, තෙනෙව උප්පජ්ජති. ආන්නකාලෙ කතෙ ච වත්තබ්බමෙව නත්ති. කටත්තා පන කම්මං පුනප්පුනං ලද්ධාසෙවනං පුරිමානං අභාවෙ පටිසන්ධිං ආකඩ්ඪති. අභි. වි. ටී., කඞ්ඛාවිතරණී විසුද්ධිනිද්දෙසවණ්ණනා. Chatta Sangayana CD Rom, Vipassana Research Institute Dhammagiri, Igatpuri,422 - 403 Disk, Nashik, India
14. සඞ්ඛෙපතො පටිසන්ධියා තීණි ආරම්මණානි හොන්ති. කම්මං, කම්මනිමිත්තං, ගතිනිමිත්තන්ති. තත්ථ කම්මං නාම ආයූහිතා කුසලාකුසලචෙතනා. කම්මනිමිත්තං නාම යං වත්ථුං ආරම්මණං කත්වා කම්මං ආයූහති. තත්ථ අතීතෙ කප්පකොටිසතසහස්සමත්ථකස්මිම්පි කම්මෙ කතෙ තස්මිං ඛණෙ කම්මං වා කම්මනිමිත්තං වා ආගන්ත්වා උපට්ඨාති. විභ. අ. විඤ්ඤාණපදනිද්දේසය, පි. 126. Chatta Sangayana

CD Rom, Vipassana Research Institute Dhammagiri, Igatpuri,422 - 403 Disk, Nashik, India

15. තථා ච මරනත්තානං පන මරණකාලෙ යථාරහං අභිමුඛීභූතං භවන්තරෙ පටිසන්ධිජනකං කම්මං වා, තං කම්මකරණකාලෙ රූපාදිකම්ම පලද්ධබුබ්බමුපකරණභූතඤ්ච කම්මනිමිත්තං වා, අනන්තර මුප්පජ්ජමානභවෙ උපලභිතබ්බමුපභොගභූතඤ්ච ගතිනිමිත්තං වා කම්මබලෙන ඡන්නං ද්වාරානං අඤ්ඤතරස්මිං පච්චුප්ටඨාති, තතො පරං තමෙව තථොපට්ඨිතං ආරම්මණං ආරබ්භ විපච්චමානකම්මානුරූපං පරිසුද්ධං උපක්කිලිට්ඨං වා උපලභිතබ්බ භවානුරූපං පරිසුද්ධං උපක්කිලිට්ඨං වා උපලභිතබ්බ භවානුරූපං තත්ථොණතංච චිත්තසන්තානං අභිණ්හං පවත්තති බාහුල්ලෙන, තමෙව වා පන ජනකභූතං කම්මං අභිනවකරණවසෙන ද්වාරප්පත්තං හොති. අභි. සං. පි. 84.

16. අඤ්ඤා සම්මුල්හකාලකිරියා නාම හොති. පරම්මුඛං ගච්ඡන්තස්ස හි පච්ඡතො තිබ්ණෙන අසිනා ඡින්දන්ති. නිපජ්ජිත්වා නිද්දායනතස්සාපි තිබ්ණෙන අසිනා සීසං ඡින්දන්ති. උදකෙ ඔසීදාපෙත්වා මාරෙන්ති. එවරූපෙපි කාලෙ අඤ්ඤතරං කම්මං වා කම්මනිමිත්තං වා උපට්ඨාති. විභ. අ. විඤ්ඤාණපදනිද්දේසය, පි. 21.

17. පච්චාසන්නමරණස්ස තස්ස වීථිචිත්තාවසානෙ භවඞගක්ඛයෙ වා චචනවසෙන පච්චුප්පන්නභවපරියොසානුභූතං චුතිචිත්තං උප්පජ්ජිත්වා නිරුජ්ඣති, තස්මිං නිරුද්ධාවසානෙ තස්සාන්තරමෙව තථාගහිතං ආරම්මණං ආරබ්භ සවත්‍ථුකං අවත්‍ථුකමෙව වා යථාරහං අවිජ්ජානුසයපරික්ඛිත්තෙන තණ්හානුසයමූලකෙන සඞඛාරෙන ජනියමානං සම්පයුත්තෙහි පරිග්ගය්හමානං සහජාතානමධිට්ඨානභාවෙන පුබ්බඞගමභූතං භවන්තරපටිසන්ධිසඞ්ඛාතං මානසං උප්පජ්ජමානමෙව පතිට්ඨාති භවන්තරෙ. අභි. සං. පි. 86.

18. කම්මචෙතනා නිරුද්ධාව පච්චයො හොති. අතීතෙ කප්ප කොටිසතසහස්සමත්‍ථකෙපි හි කම්මං එතරහි පච්චයො හොති. එතරහි ආයූහිතං අනාගතෙ කප්පකොටිසතසහස්සපරියොසානෙපි පච්චයො හොතීති. එවං පුබ්බාපරතො වෙදිතබ්බා. විභ. අ. පි. 21.

19. තතො පවත්තියං හුත්වා, භවඞගං යාවතායුකං බලවාරම්මණෙ හුත්වා, තදාරම්මණමෙව ච. අභි. තා. පි. 117.

20. අභි. තා. පි. 121.

21. චුතිතො පන පුන පටිසන්ධි, පටිසන්ධිතො පුන භවඞගන්ති එවං භවගතිඨිතිනිවාසේසු සංසරමානානං සත්තානං අවිච්ඡින්නං චිත්තසන්තානං පවත්තතියෙව. යො පනෙත්‍ථ අරහත්තං පාපුණාති, තස්ස චුතිචිත්තෙන නිරුද්දෙ නිරුද්ධමෙව හොතීති. වි.ම., ඛන්ධනිද්දෙසය, පි. 566.



22. රාජා ආහ. භන්තෙ නාගසේන, යො උප්පජ්ජති, සො එව සො, උදාහු අඤ්ඤොති. ථෙරා ආහ. න ච සො, න ච අඤ්ඤොති.
සුමංගල නාහිමි, හීනටිකුඹුරේ, සිංහල මිළිඳ ප්‍රශ්නය, පි. 47.

23. ථෙරො ආහ. න ච සො, න ච අඤ්ඤොති.
සුමංගල නාහිමි, හීනටිකුඹුරේ, සිංහල මිළිඳ ප්‍රශ්නය, පි. 47.

24. භියෙය්‍යා ඔපම්මං කරොහීති යථා, මහාරාජ. ඛීරං, දුය්හමානං කාලන්තරෙන දධිපරිවත්තෙය්‍ය, දධිතො නවනීතං, නවනීතතො ඝතං පරිවත්තෙය්‍ය, යො නු ඛො, මහාරාජ, එවං වදෙය්‍ය යෙව ඛීරං තං යෙව දධිණ් යං යෙව දධි තං යෙව නවනීතං යං යෙව නවනීතං තං යෙව ඝතින්ති, සම්මා නු ඛො සො, මහාරාජ වදමානො වදෙය්‍යාති නහි භන්තෙ, තංයෙව නිස්සාය සම්භූතන්ති එවමෙව ඛො, මහාරාජ ධම්මසන්තති සන්දහති, අඤ්ඤො උප්පජ්ජති, අඤ්ඤො නිරුජ්ඣති, අපුබ්බං අචරිමං විය සන්දහති, තෙන න ච සො. න ච අඤ්ඤො පුරිමවිඤ්ඤාණෙ පච්ඡිම විඤ්ඤාණං සඞගහං ගච්ඡති. සුමංගල නාහිමි, හීනටිකුඹුරේ, සිංහල මිළිඳ ප්‍රශ්නය, පි. 48.

25. The problem of continued individuality after death was still more difficult, for, as milinda points our, it is connected with the whole question of morl responsibility. When pressed for an explanation, nagasena seeks reuge in the quibble that the person who is neither the same as the person who died, nor is he another. (Na ca so na ca anna), Sarachchandra, Ediriira, Buddhist Psychology perception, 82 pg.

26. Ibd, 75 pg.

27. භන්තෙ නාගසෙන, යො සුපිනං පස්සති, සො නිද්දායන්තො, උදාහු ජාගරන්තො පස්සතී තී? සුමංගල නාහිමි, හීනටිකුඹුරේ, සිංහල මිළිඳ ප්‍රශ්නය, පි. 427.

28. සුමංගල නාහිමි, හීනටිකුඹුරේ, සිංහල මිළිඳ ප්‍රශ්නය, පි. 427.

29. මහාරාජ, සුපිනං පස්සන්ති, වාතිකො සුපිනං පස්සති, පිත්තිකො සුපිනං පස්සති. සෙමහිකො සුපිනං පස්සති, ද්වෙත? පසංහාරතො සුපිනං පස්සති, සමුදාචිණ්ණතො සුපිනං පස්සති. පුබ්බනිමිත්තතො සුපිනං පස්සති, තත්‍ථ මහාරාජ, යං පුබ්බනිමිත්තො සුපිනං පස්සති, තං යෙව සච්චං. අවස්සෙං මිච්ඡති, තී. සුමංගල නාහිමි, හීනටිකුඹුරේ, සිංහල මිළිඳ ප්‍රශ්නය, පි. 425.

30. Sarachchandra eddiriwira, Buddhist psychology of perception. 82 pg.

31. පටිසන්ධිවිඤ්ඤාණෙ පන නිරුද්ධෙ තං තං පටිසන්ධිවිඤ්ඤාණ මනුබන්ධමානං තස්ස තස්සෙව විපාකභූතං තස්මිඤ්ච ආරම්මණෙ

තාදිසමෙව භවඞ්ගවිඤ්ඤාණං නාම පවත්තති. පුනපි තාදිසන්ති එවං අසති සන්තානවිනිවත්තකෙ අඤ්ඤස්මිං චිත්තුප්පාදෙ නදීසොතං විය සුපිනං අපස්සතො නිද්දොක්කමනකාලාදීසු අපරිමාණසඞ්ඛ්‍යම්පි පවත්තතියෙවාති එවං තෙසඤ්ඤෙව විඤ්ඤාණානං භවඞ්ගවසොතාපි පවත්ති වේදිතබ්බා. වි.ම. ඛන්ධනිද්දෙස්සය, පි. 566.

32. තඤ්චපන්තෙං චතුබ්බිධම්පිසුපිනං සෙඛපුථුජ්ජනාව පස්සන්ති අප්පහීනවිපල්ලාසත්තා, අසෙක්ඛා පන න පස්සන්ති ඛහීනවිප්පලාසත්තා, කිං පන්තෙං පස්සන්තො සුත්තො පස්සති පටිබුද්ධො, උදාහු නෙව සුත්තො න පටිබුද්ධොති? කිඤ්චෙත්ථ යදි තාව සුත්තො පස්සති අභිධම්මවිරොධො ආපජ්ජති, භවඞ්චිත්තෙනහි සුපති තං රූපනිමිත්තාදී ආරම්මණං රාගාදිසම්පයුත්තං වා න හොති, සුපිනං පස්සන්තස්ස ච ඊදිසානි චිත්තානි උප්පජ්ජන්ති. සමන්තපාසාදිකා විනය අට්ඨකථා, පාරාජිකා ඛාණ්ඩය, පි. 169.

33. මහරජාණෙනි, යම් පුරුසයෙක් ස්වප්න දක්නේ ද, ඒ පුරුෂ තෙම නිදිමත වෙමින් නොදක්නේ ය. නිදිවර්ජිත වෙමිනුත් නොදක්නේ ය. කපි නිද්‍රාවට පැමිණියහුගේ චිත්තය කැදැල්ලට වන් පක්ෂියකු මෙන් භවඞගත වන්නේ ය. හෘදය වස්තුව නිසා පවතින්නා වූ ඒ භවඞගත චිත්තය කිසිවක නොපවත්නේ ය. ඒ කිසිවක නොපවත්නා චිත්ත කිසි සැප දුකක් නොම දන්නේ ය. සුවදුක් විභාග නොදන්නා චිත්තයට ස්වප්න අරමුණක් නොවන්නේ ය. සුවදුක් ආදියෙහි චිත්තය පවත්නා කල්හිම ස්වප්න නොපෙනෙන්නේ ය.'' සුමංගල නාහිමි, හීනටිකුඹුරේ, සිංහල මිළින්‍ද ප්‍රශ්නය, පි. 427.

34. අභි. වි. ටී. වීථිචිත්තවණ්ණනා. ඡ. සං.

35. දෙව අහෙතුක මනො විඤ්ඤාණධාතුයො ඡළාරම්මණ විජානනලක්ඛණා සන්තීරණදිරසා තථාභාව පච්චුපට්ඨාන හදයවත්‍ථුපදට්ඨානානි වෙදිතබ්බො. ඉට්ඨමජ්ඣත්තාරම්මණෙ පවත්ති සම්භවතො උපෙක්ඛාසහගතාහුත්‍වා සන්තීරණ තදාලම්බන පටිසන්ධි භවඞග චුති වසෙන අභි. තා. පි. 129.

36. ගල්මංගොඩ සුමනපාල, 2008, ආභිධම්මික විවරණ සහ බෞද්ධ චින්තාවේ සංවර්ධනය. සරස්වති ප්‍රකාශන, පි. 119.

37. සං. නි. I, පඨමජනෙති සූත්‍රය, බු. ජ. මු., පි. 68.

38. සං. නි. II, කොසම්බිය සූත්‍රය, බු. ජ. මු., පි. 186.

39. තෙසු උස්සුක්කජාතෙසු, භවසොතානුසාරීසු, කොධ තණ්හං පජහිංසු කෙ ලොකස්මිං අනුස්සුකාති. සං. නි. I, දේවතා සංයුක්තය, මහාද්ධන සූත්‍රය, බු. ජ. මු., පි. 30.



40. පුරිසස්ස විඤ්ඤාණසොතං පජානාති. උභයතො අබ්බොච්ඡින්නං ඉධ ලොකෙ පතිට්ඨිතඤ්ච පරලොකෙ පතිට්ඨිතඤ්ච. දී. නි., සම්පසාදනීය සූත්‍රය, බු. ජ. මු., පි. 166.

41. Harvey, Peter, The Selfless mind per sonality. Consciousness and Nirvana in Early Buddhism. First publishd in 1995 loy Curzon press. 157- 160 pgs.

24. ය්වායං ආවුසො මතො කාලකතො, යොචායං භික්ඛු සඤ්ඤා වෙදයිත නිරෝධං සමාපන්නො ඉමෙසං කිං නානාකරණං ති? ම. නි., මහාවේදල්ල සුත්ත, බු. ජ. මු., පි. 684.

34. ය්වායං ආවුසො මතො කාලකතො, තස්ස කායසංඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා, වචී සංඛාරා නිරුද්ධා, පටිප්පස්සද්ධා චිත්ත සංඛාරා නිරුද්ධා පටිප්පස්සද්ධා ආයුපරික්ඛීණො, උස්මා වූපසන්තා, ඉන්‍ද්‍රියානි විප්පසන්නානි, ය්වායං ආවුසො මතො කාලකතො යොචායං භික්ඛු සඤ්ඤා වෙදයිත නිරොධං සමාපන්නො ඉදං තෙසං නානාකරණන්ති ම. නි. II, මහාවේදල්ල සුත්ත, බු. ජ. මු., පි. 684.

44. ආයු උස්මා ච විඤ්ඤාණන්ති, රූපජීවිතින්‍ද්‍රියං කම්මතෙජොධාතු චිත්තන්ති. පපඤ්චසූදනි II, පි. 370.

45. ඤාණසීහ හිමි, හේන්පිටගෙදර, අභිධර්ම පරීක්ෂණය, සමයවර්ධන මුද්‍රණ ශිල්පියෝ, හික්කඩුවේ සුමංගල නාහිමි මාවත, මරදාන, කොළඹ 10, පි. 03.

46. අනෙකපරියායෙනාවුසො සාති, පටිච්චසමුප්පන්නං විඤ්ඤාණං වුත්තං භගවතා, අඤ්ඤත්‍ර පච්චයා නත්‍ථිවිඤ්ඤණස්ස සම්භවොති, ම. නි. I, මහාතණ්හාසංඛ්‍ය සූත්‍රය, බු. ජ. මු., පි. 624.

47. හෙට්ටිආරච්චි, ධර්මසේන, බුදුදහමේ මූලික ඉගැන්වීම්, ශාස්ත්‍රපති ගුණසේණ මහතන්ත්‍රීගේ, සරස්වතී ප්‍රකාශන, නො. 2/60, රවුම් පාර, දිවුලපිටිය, පිටු, 121- 122.

48. යස්මිං ච වච්ඡ, සමයෙ ඉමං ච කායං නික්ඛිපති, සත්තො ච අඤ්ඤතරං කායං අනුප්පන්නො හොති, තම්හං තණ්හූපාදානං වදාමිඡ තණ්හා සමඞගිස්ස වච්ඡ, තස්මිං සමයෙ උපාදානං හොති සං. නි. වච්ඡගොත්ත සූත්‍රය, බු. ජ. මු., පි. 288.

49. අං. නි. II, දුතියග්ග සූත්‍රය, බු. ජ. මු., පි. 148.

50. Hamilton, Sue, The identity and experience constitution of the human Being According to Early Buddhism, Luzac Oriental 46, Great Russell Street, London.Wci 1996.83 pg.

51. සං. නි. V, බීජ සූත්‍රය. බු. ජ. මු., පි. 140.

52. පුරිමකම්මභවස්මිං මොහො අවිජ්ජා, ආයූහනා සඞඛාරා, නික්කන්ති තණ්හා, උපගමනං උපාදානං, චේතනා භවො, ඉමෙ පඤ්ච ධම්මා පුරිමකම්මභවස්මිං ඉධ පටිසන්ධියා පච්චයා. ඉධ පටිසන්ධි විඤ්ඤාණං, ඔක්කන්ති නාමරූපං, පසාදො ආයතනං, ඵුට්ඨො ඵස්සො, වේදයිතං වේදනා, ඉමෙ පඤ්ච ධම්මා ඉධුප්පත්තිභවස්මිං පුරෙකතස්ස කම්මසස පච්චයා. ඉධ පරිපක්කත්තා ආයතනානං මොහො අවිජ්ජා, ආයූහනා සඞඛාරා. නිකන්ති තණ්හා උපගමනං උපාදානං. චෙතනා භවො. ඉමෙ පඤ්ච ධම්මා ඉධ කම්මභවස්මිං ආයතිං පටිසන්ධියා පච්චයා. ආයතිං පටිසන්ධිවිඤ්ඤාණං, ඔක්කන්ති නාමරූපං, පසාදො ආයතනං ඵුට්ඨො ඵස්සො, වෙදයිතං වෙදනා, ඉමෙ පඤ්ච ධම්මා ආයතිං උප්පත්තිභවස්මිං ඉධ කතස්ස කම්මස්ස පච්චයා. ඉති මෙ චතුසඞඛෙපෙ තයො අද්ධෙ තිස්සන්ධිං වීසතියා ආකාරෙහි පටිච්චසමුප්පාදං ජානාති පස්සති අඤ්ඤාති පටිවිජ්ඣති. තං ඤාතට්ඨෙන ඤාණං. පජානනට්ඨෙන පඤ්ඤා. අං. නි. I, පි. 94.

53. Sarachchandra eddiriwira, Buddhist psychology of perception.90 pg.